# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/41 - 2022 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

9(2)(ආආ)(i) වගන්තිය යටතේ නිවේදනය

මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මම 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(2)(ආආ)(i) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව එකී 9 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම හා පළමුවරට ජාතික හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත්‍රයකට අදාළව 2022.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් දෙසීයයක ගාස්තුවක් ගෙවිය යුතු බව මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරමි.

මෙම කාරණයට අදාළව 2018 අගෝස්තු මස 09 වැනි දින අංක 2083/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

ටිරාන් අලස්,
මහජන ආරක්ෂක අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ දී ය.

1A - G 37766 — 08 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

16(2)(ආ)(i) වගන්තිය යටතේ නිවේදනය

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 16(2)(ආ)(i) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මම 2022.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි එකී 16 වන වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක අනු පිටපතක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් දහසක් විය යුතු යයි මෙම නිවේදනයෙන් නියම කරමි.

මෙම කාරණයට අදාළව 2018 අගෝස්තු මස 09 වැනි දින අංක 2083/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

**ටිරාන් අලස්,**
මහජන ආරක්ෂක අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ දී ය.

---

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

දැන්වීමයි

***පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17 (2) වගන්තිය යටතේ හැඳුනුම්පත්වල සංශෝධිත අනුපිටපත් නිකුත් කරනු ලැබීමේ දී හා 17 (4) වගන්තිය යටතේ වලංගු කාලය ඉකුත් වූ, ජාතික හැඳුනුම්පතක් වෙනුවට නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබීමේ දී අය කරන ගාස්තු සංශෝධනය කිරීම***

2022.11.01දින සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පහත උපලේඛනයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලබන ගාස්තු ඒ ඒ කාර්යයට ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

මෙම කාරණයට අදාළව 2018 අගෝස්තු මස 09 වැනි දින අංක 2083/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

**ටිරාන් අලස්,**
මහජන ආරක්ෂක අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| | *කාර්යය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| 01. | 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17(2) වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක සංශෝධිත අනු පිටපතක් නිකුත් කිරීම. | 500/- |
| 02. | 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17(4) වගන්තිය යටතේ වලංගු කාලය ඉකුත් වූ, ජාතික හැඳුනුම්පතක් වෙනුවට නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම | 200/- |

EOG 10 - 0107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.